Page 8 May 2010 .qxd 21/05/2010 15:55 Page 1



## කවි කොළය



## නායකතුමනි !

නැගුණද පවුල් බලයෙන් මුදුනට කන්ද
දහ අට වරක් පැරදුණු සටනින් ජන්ද
ජනතා පැතුම් තේරුම් ගනු බැරි අන්ද
නායකතුමනි! අලි වෙස් මුහුණක් බැන්ද

ඇති තැන බලය නැති බව පවසති මොළය
මොළයක් ඇතත් ඉන් අරගෙන නැත පලය
මේ අත් බවයෙ නොලබන පාලන බලය
ඔබ වෙනුවෙන්ය අද ලියැවෙන කවි කොළය

ඩී ඇස් ඩඩ්ලි වැනි අය දත් ගැමි ආර
අදටත් ලබද්දි ජනතා උප හාර
එන හැම කුණුගොඩම ඔබ අරගෙන බාර
ඒ අයගෙන්ම කනවා දැළි පිහි පාර

නිදියන විටදි වත් වැතිරී යහන මත
කලිසම මිසක සරමක් ඇඳ පුරුදු නැත
තම මතයම විනා සෙසු උදවියගෙ මත
නොතකයි තඹේකට ඔබගේ උඩඟු සිත

පිළිකුල නිසා ඇති දහඩිය ගඳට ඇඟේ
ජනයා මැදට ගොවි කම්කරු පිරිස වගේ
කිසිවිට නොයයි අදහස් ඇත රදළ යුගේ
කුඹුරක ඇවිද නැත බඹයක් නියර දිගේ

සිංහල සිරිත් ගැන හැඟුමක් නැති හින්දා
සංකර බායි ඇඳුමක් බිරිඳට අන්දා
පෝදා කැළණියට ඔබ ගෙන යයි කැන්දා
ගංගාරාමයට එය කොහොමද මන්දා

ලොක්කන් අතර මිස බලගතු කොළඹ හතේ
ඔබ අද අපේ සුලු ජනයා සමග නැතේ
හැඳ ටයි කෝට් ඇවිදියි පිළිවෙලට පොතේ
මේ ලෙස ගියොත් ගොඩයාමක් නොමැත පුතේ

හොඳ මිනිසෙකු වුවද දිවිමග නොකළ කැත
පිළිවෙත් ඔබේ ජනතාවට නොමැත හිත
හැට පිරි මහල්ලන් මිස ලොම් හැළුණු ගත
මෙරටේ තරුණ පරපුර ඔබ සමග නැත

මග අවුරවා අළුතෙන්
එන කොල්ලන් ට
බෙදුවා පලා පාටියෙ
වැඩි මල්ලන් ට
මේ ලෙස ගියොත් හෙම
එක තැන පල්වෙන් ට
අලියට වැලුත් නැතිවිය
හැක එල්ලෙන් ට



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# මැයි දිනයේ තොරතුරු බිඳක්

**ලෝ**ක කම්කරු දිනය ගිය සතියේ මැයි **1** දිනට යෙදී තිබුණි. සමහරු මෙය මැයි දිනය ලෙසද ව්‍යවහාර කරති. **1886** මැයි **1** වෙනි දින ඇමරිකාවේ චිකාගෝ නගරයේ කම්හලක සේවකයෝ වැඩමුරය පැය අට දක්වා අඩුකර ගැනීමට අරගලයක් දියත් කළහ. පාලකයෝ පොලීසිය ලවා පෙළපාලිකරුවන්ට වෙඩිතැබූ අතර ඉන් කීපදෙනෙක් මියගියහ. වෙඩි වැදුණු අයගේ රුධිරයෙන් තෙත්වී රතුපැහැ ගැන්වුණු ඇඳුම් තම අරගලයේ සම්මත ධජය ලෙස ප්‍රකාශයට පත්කොට ලොව සැමතැනම මැයි **1** වෙනි දින විවිධ කම්කරු පෙළපාලි, රැස්වීම්, සමරු වැඩ සටහන් පවත්වති.



**ඒ. ඊ. ගුණසිංහ මහතා**

ශ්‍රීලංකාවේ කම්කරු සටන් ඉතිහාසයට ප්‍රබල අතීතයක් ඇත. **1896** දී කොළඹ කරත්ත කරුවන්ගේ වර්ජනය, රෙදි සෝදන්නන්ගේ වර්ජනය, **1916** දී ට්‍රෑම් රථ වර්ජනය ඉතිහාසයේ සනිටුහන් වෙයි. ඒ. ඊ. ගුණසිංහ මහතා ශ්‍රීලංකා කම්කරු ව්‍යාපාරයේ පියා ලෙ සැලකේ. **1920** ගණන් වලදී ඉංග්‍රීසි ගුරුවරයෙකු වූ ගුණසිංහ මහතා කම්කරුවන් වෙනුවෙන් එවක සුදු පාලකයන් සමග භාෂා පරිවර්තකයෙකු ලෙස කටයුතු කළේය. අවසාන යේදී එතුමා කම්කරුවන්ට නායකත්වය දෙමින් ලංකා කම්කරු පක්ෂය පිහිටුවාගෙන ක්‍රියාකාරී වීය. කම්කරු අරගලයන්ට නායකත්වය දීමේ වරදට වරක් පාලකයෝ ඔහුට දඩ මුදල් නියම කළෝය. එහෙත් දඩ මුදල් නොගෙවා ඊට දුන් විකල්පය වූ පාරේ ගල් තැලීමට තීරණය කළේය. ගුණසිංහ මහතා එදා ගල් තැලුවේ කම්කරු ශ්‍රමයේ වටිනාකම පෙන්වා දෙමිනි.

ඒ. ඊ. ගුණසිංහ **1931** දී ලංකා පාර්ලිමේන්තුවට තේරී පත්විය. පසු කලෙක එතුමාගේ අනුගාමිකයන් දෙදෙනෙකු වූ කේ. වින්සන්ට් පෙරේරා සහ ආර්. ප්‍රේමදාස කම්කරු පක්ෂයේ කටයුතු මෙහෙයවූහ. වින්සන්ට් පෙරේරා මහතා කොළඹ නගරාධිපති මෙන්ම කැබිනට් ඇමතිවරයෙකුද වූ අතර, ආර්. ප්‍රේමදාස මහතා අගමැති හා ජනාධිපති ධුරවලට පත්විය. මෙම කම්කරු නායක ගුණසිංහ මහතාට උපහාර පිණිස පිටකොටුවේ සෝන්ඩර්ස් පෙදෙස ගුණසිංහ පුර ලෙස නම් කොට ඒ. ඊ. ගුණසිංහ පිළිරුවක්ද ඉදිකරලීමට ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයා කටයුතු කළේය.

ශ්‍රීලංකාවේ කම්කරු අරගලවලට පසුකාලීනව සමාජවාදී පක්ෂ නායකත්වය දුන්හ. එන්. එම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන, කොල්වින් ආර්. ද සිල්වා, ලෙස්ලි ගුණවර්ධන ආදීහු මෙහි පෙරමුණ ගත්හ. කම්කරු අරගලවල දී ශ්‍රීලංකාවේ කීපදෙනෙකුට ජීවිතය පවා අහිමි වූ අතර, කොලොන්නාවේ වී. කන්දසාමිගේ මරණය කම්කරු අතීතය පිළිබඳ මතකයේ ප්‍රබලව සටහන් වන්නකි.

ඇස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා **1956** දී බලයට පැමිණීමෙන් පසු මැයි **1** වන දින රජයේ නිවාඩු දිනයක් කළේය. **1957** දී එම රජයේ අනුග්‍රහයත් ඇතිව පැවැත්වූ ප්‍රථම මැයි දිනයට එවකට චීන අගමැති චෞ එන් ලායි මහතාද පැමිණ සහභාගි වූයේ ය. ලෝකයේ බොහෝ රටවල මැයි දිනය නිවාඩු දිනයක් වුවද මහා බ්‍රිතාන්‍යයේ මැයි දින නිවාඩුව ලබා දෙන්නේ ආසන්න සඳුදා දිනයකය.

බ්‍රිතාන්‍ය මැයි දින වැඩ සටහන්වල අපූර්වතම සම්ප්‍රදායක් නොකඩවා ඉටුකරනු ලබන්නේ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් විසිනි. මැයි **1** වෙනි දින හිමිදිරි පාන්දර **5** ට පමණ මැග්ඩලන් පීඨයේ ඉහළම මාලයට නගින සිසුහු ගීතිකා ගයා අවසානයේ මැග්ඩලන් පාලම මතට විත් තේම්ස් නදියට පනිති. මෙම අනතුරු සහගත පැනීම පොලීසියෙන් තහනම්කර පාලම වසා තිබුණද ශිෂ්‍යයෝ මෙල්ල නොවූහ. මැයි **1** වෙනි දිනට පෙර දින රාත්‍රියේ ඔක්ස්ෆර්ඩ් නගරයේ සියළු අවන්හල්, බාර් හා බීම හල් එළිවන තුරා විවෘතව තැබීමද සිදුකෙරේ. මෙම ගඟට පැනීමේ චාරිත්‍රය සම්ප්‍රදායක් බව සිසුහු පවසති.



ලංකාවේ දැන් දැන් මැයි දින කම්කරු පෙළපාලි පක්ෂ දේශපාලන ස්වරූපයක් උසුලයි. වැඩකරන ජනතාවගේ සහභාගිත්වයෙන් තොරව දේශපාලන සගයින්ගේ මූලිකත්වයෙන් යුතුව කෙරෙන මැයි දින පෙළපාලි අද කොළඹ නගරයේ ප්‍රධාන තැනක් ගනී.

*ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී*
♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Major V. B. Karunaratne**
***Ex Deputy Sergeant-At-Arms in Sri Lanka Parliament***
**Oxford UK**



**ඉරිදා** - ලංකාවෙ ඡන්ද ප්‍රතිපල වලින් පස්සෙ සමහර අපේ-
**SUN** ක්ෂකයො පැමිණිලි කරළා මනාප දූෂණයක් සිද්ධ වුනයි කියලා. දෙවනි සැරේ ගණින කොට සමහරුන්ගෙ පළවෙනිසැරේ ආපු ගණන අඩුවෙලා. තව සැරයක් ගැන් නම තව අඩුවෙලා. කවුද මතයක් ගෙනැත් තියනවා, ඒ ඡන්ද ගණන් කරන්න දාපු නිලධාරීන්ට ගණන් කරන්න දන්නෙ නැත කියලා. නිලධාරි කියනවලු අපේ වැරැද් දක් නෙවෙයිය, මේ කච්චේරියෙ භූතදෝෂයක් තියනවයි ගණන් කෙරුවයින් පස්සෙ ඒ ඉලක්කම් අවුල් කරන්නෙ භූතයෙක්ය කියලා. ඒකියන්නෙ භූතයින්ටත් කොම්පියුටර් තාක්ෂණය තේරෙනව කියන එකයි. පස්සෙ ඇමතියෙක් යෝජනා කළාලු තියනවා, මීට පස්සෙ ඡන්දයකදි කච්-චේරියෙ ඇතුළෙ පානක් පත්තු කරලා, භූතයින්ට පින් දීලා ඡන්ද ගණන්කිරීම පටන්ගන්න කියලා.

**සඳුදා** - මෙන්න එංගලන්තෙ ඡන්ද ප්‍රතිඵලත් තීරණයක්
**MON** නැතුව හිරවෙලා. ආණ්ඩුවක් පිහිටුවන්න බැරුව පක්ෂ නායකයො වළිකනවා. ලංකාවෙ වගේම තමයි, සුළු පක්ෂ එක්ක එක්කහු වෙන්න බලනවා. සුළු පක්ෂ බොරුවට බැහැයි කියනවා. අනික් කස්ටිය ඇවිත් සාකච්ඡා කරනවා. අගමැති ගෝඩන් බ්‍රවුන් කියනවා මම තවම අගමැතිය කියලා. කොන්සර්වේටිව් කස්ටිය හිතනවා බ්‍රවුන් පැරදිලත් අගමැතිකම දාලා යන්න කැමති නැත කියලා. දේශපාලකයා කොහෙත් එකයි. එතන තියෙන්නෙ බලයට තියන තන්හාව. මෙච්චර කල් මේ හාදයො අපේ රටවල ඡන්ද ගැන හිනාවුණා. දැන් අනික් රටවල් මේ ගොල්ලන්ට හිනාවෙනව.

**කුජදා** - මේත් එංගලන්තෙ ඡන්දෙදි ගිය සතියෙ වෙච්ච
**TUE** දෙයක්. ඡන්ද කාඩ් එකෙත් තිබුණා, කවුරුත් දැන ගෙනත් හිටියා, 6 වෙනිදා රෑ දහය වෙන කල් ඡන්දෙ දාන්න ඇහැකිය කියලා. ඡන්ද දායකයො රෑ නමයට ගියාම සමර ඡන්ද පොළවල් වහලා ගේට්ටුවල ඉබ්-බොත් දාලා. සමහරු කැගහලත් ඉඩදීලා නැහැ. දැන් බැහැයි කිව්වලු. මේ කරුණාකරලා මෙතනින් යන්න.. මේක වහලා.. දැන් ඡන්දෙ දාන්න බැහැ... කියලා, ඒ මිනිස්සු හරවලා යවලා. ඡන්දෙ දාන්න බැරි වෙච්ච පාඩුවට හරියන්න, රජයෙන් පවුම් 750 ක් බැගින් ගෙව නවා කියලා කතාවක් තියනවා. අපේ අල්ලපු ගෙදර ක්ලේරා කියනවා ඔය වගක් දන්නව නම් එයත් හිතලම පරක්කු වෙලයි ඡන්දෙ දාන්න යන්නෙ කියලා.

**බුදදා** - අනාගතය ගැන මට නම් හරි බයක් හිතෙනවා.
**WED** කොහෙන් මේ ප්‍රශ්න කෙළවරවේද කියලා. එංග-ලන්තෙ ඇතුළු යුරෝපයේ රටවල් දැන් මහා අවුල් ජාලා වෙලා. ඒ අතරෙ එක එක රටවල සරණාගතයොයි සාමාන්‍ය ජනයයි වැල නොකැඩී කඩාගෙන මේ පැත්-තට එනවා. ත්‍රස්තවාදීයො අස්සක් මුල්ලක් නැර පිරිලා. උන් අඳුනගන්නත් අමාරුයි. ආර්ථිකය පතුළටම වැටිලා. දේශපාලනේ පිරිහිලා. ලංකාව අවුරුදු 30ක් පුරා තිබ්බව ත්‍රස්තවාදෙ නැතිකරපු එක ලොකු දෙයක්. ඒක ඇත්තට ලංකාවෙ මහා වාසනාවක්. ආර්ථික අතින් අපේ රට ලංකාව දැන් ක්‍රමයෙන් ඔලුව උස්සගෙන එනවා. ඒ ගැන අහන්නත් සංතෝෂයි. ජයවේවා!

**ගුරුදා** - මම අපේ තලවකැලේ නැන්දම්මට අද කතාකළා.
**THU** එංගලන්තෙ ඡන්දෙ ගැන එයාට කිව්වා. පක්ෂ නාය-කයො වැඩි බලයක් ගන්නෙ කොහොමද කියලා තවම කල්පනාකරනවා කියලත් කිව්වා. නැන්දම්මා කියනවා "දුවේ ඕක සුළු දෙයක්. ලංකාවෙ නම් ඔච්චර බල බල ඉන්නෙ නැහැ. ඒ පක්ෂෙන් මේ පක්ෂෙට කීප දෙනෙක් පන්නගත්ත, එතකොට වැඩි බලේ ලැබෙනව, එතකොට ආණ්ඩුව පිහිටුවනවා. හැබැයි කොහොමද මන්ත්‍රීවරු පන්න ගන්නෙ කියලා මගෙන් අහන්න එපා. ඒවට පොඩි ක්‍රම සහ විධි තියනවා" කියලා නැන්දම්මා හිනා වුණා. මට හිතනවා අගමැති ගෝඩන් බ්‍රවුන්ට කියන්න ඉක්මනට අපේ නැන්දම්මට කතාකරන්න කියලා.

**කිවිදා** - ලෝක මැයි දිනය මැයි පළවෙනිදා. ඉස්සර මැයි
**FRI** දිනේ ලෝකය පුරාම සැමරුවා කම්කරුවාගේ දිනය හැටියට. දැවැන්ත පෙළපාලි. රතුකොඩි, රතු කමිස හැම තැනම දකින්න ලැබුණා. මැයි පළවෙනිදා ලෝකෙ පුරා නිවාඩු දවසක් වුණා. දැන් හුහක් රටවල් වලට මැයි දිනේ අමතක වෙලා. ඉස්සර තිබුණු ඒ උනන්දුව බිංදුව ටම හිදිලා. මං හිතන විදියට හේතුව මේකයි. කොමියු-නිස්ට් වාදය දැන් ලෝකෙන් අඩුවෙමින් යනවා. ඒ නිසාම කම්කරුවා දැන් කාටත් අමතක වෙලා.

**ශනිදා** - සෝමතුංග බාප්පලා යාපනේ ගිහිං ලොකු පුතාට
**SAT** ගේ බලාගන්න කියලා. දවාලෙ හිඟන්නෙක් ආවලු. පුතා කිව්වලු, කවුරුවත් ගෙදර නැහැ කියලා. "එහෙනම් මම හවස එන්නම්" කියලා හිඟන්න කිව්වම, මේ ගොන් නාම්බ කිව්වලු, "හවස ආවට වැඩක් නැහැ.... ගෙදර සේරම යාපනේ ගිහිං.... මමත් තව ටිකකින් දොරවහලා රත්නපුරේ යනව..." කියලා. "එහෙනම් මහත්තෙයො මං යනව" කියලා හිඟන මැන් ගියාලු. එදා රෑ ගේ සේරම සුද්ද කරලා. ජනේල උළුවහු විතරක් තියලා.